පේරාදෙණිය විශ්වවිද්‍යාලය

# UNIVERSITY OF PERADENIYA, SRI LANKA

දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

## CENTRE FOR DISTANCE AND CONTINUING EDUCATION

ශාස්ත්‍රවේදී සාමාන්‍ය උපාධි පරීක්ෂණය බාහිර - 2018 නොවැම්බර්/දෙසැම්බර්

**GENERAL DEGREE EXAMINATION IN IN ARTS (EXTERNAL) - NOVEMBER/DECEMBER 2018**

ග්‍රීක සාහිත්‍යය සහ සාහිත්‍යය සිද්ධාන්ත **WCCG 1**

(නව නිර්දේශය)

**මෙහි අඩංගු මුළු ප්‍රශ්න සංඛ්‍යාව 12 කි.**

**පළමුවන ප්‍රශ්නයටත්, යටත් පිරිසෙන් එක් කොටසකින් ප්‍රශ්න දෙක (02) බැගින් තෝරාගෙන තවත් ප්‍රශ්න හතරකටත් (04) පිළිතුරු සපයන්න.**

**කාලය : පැය තුනයි (03)**

---

1. පහත සඳහන් උද්ධෘත පාඨ අතරින් හතරක අවස්ථා සම්බන්ධය දක්වා ඒවායේ අන්තර්ගතය පිළිබඳ විග්‍රහ කරන්න.

   a) Servants, do as you have been bidden;
   Make haste, carpet his way with crimson tapestries,
   Spread silk before your master's feet; Justice herself
   Shall lead him to a home he never hoped to see.

   b) This day brings you your birth; and brings you death.

   c) So I must trace for you the path my thoughts followed.
   When love struck me, I searched for the best way to endure
   The wound.

   d) Now, whichever of you can think of the best piece of advice to give Athenians at this juncture, he's the one I shall take back with me.

   e) Herodotus of Halicarnassus, his Researches are here set down to preserve the memory of the past by putting on record the astonishing achievements both of our own and of other peoples; and more particularly, to show how they came into conflict.

   f) Your great glory is not to be inferior to what God has made you, and the greatest glory of a woman is to be least talked about by men, whether they are praising you or criticizing you.

   g) According to Greek mythology, humans were originally created with four arms, four legs and a head with two faces. Fearing their power, Zeus split them into two separate parts, condemning them to spend their lives in search of their other halves.

(5x4)

## I කොටස - ග්‍රීක සාහිත්‍යය

2. "ඊස්කිලස්ගේ ***ඇගමෙම්නන්*** නාට්‍යයේ, ක්ලයිටම්නෙස්ට්‍රා විවිධ චරිත නිරූපණය කරයි. එම චරිත විවිධ කාව මඟින් විශ්ලේෂණය කල හැක." මෙම මතයේ සත්‍යතාවය නාට්‍යයේ උදාහරණ ඇසුරින් විමසන්න.

3. දෘෂ්ඨිය/දැක්ම සහ අන්ධභාවය යන මත සොෆොක්ලීස් ගේ ***ඊඩිපස් රජ*** නාට්‍යය ඇසුරින් සාකච්ඡා කරන්න.

4. රාගය සහ පතිවත පිළිබඳ පවතින අරගලය යුරිපිඩීස් ගේ **හිපොලිටස්** නාට්‍යය ඇසුරින් විශ්ලේෂණය කරන්න.

5. "සෑම විටම අපි ඇරිස්ටොෆනීස් ගේ ***මැඩියෝ*** නාට්‍යය පිළිබඳ විමසන විටදී, අපි ඇතීනියානු ශෝකාන්තය එහි ගැබ්වී ඇති සැටි සාකච්ඡා කරනු ලැබේ". ඔබ මෙම කියමන සමඟ කෙතෙක් දුරට එකඟ වන්නේද ? ඔබගේ පිළිතුර නාට්‍යයේ උදාහරණ සහිතව විමසන්න.

6. හෙරඩෝටස් ඓතිහාසික කරුණු ඉදිරිපත් කරන ක්‍රමවේදය ඔහුගේ ***ඉතිහාසය*** කෘතිය ඇසුරින් විග්‍රහ කරන්න.

7. පෙරික්ලීස්ගේ අවමංගල්‍ය කථනය (Funereal Speech) තුසඩිඩීස්ගේ **පෙලපනීසියානු යුද්ධයේ ඉතිහාසය** ඇසුරින් විවේචනාත්මකව සාකච්ඡා කරන්න.

8. "ප්ලේටෝගේ ***මධුසාදය*** සංකීර්ණ පැනයක් වන ප්‍රේමය පිළිබඳව සාකච්ඡා කරයි". මෙම ප්‍රකාශය ප්ලේටෝගේ ***මධුසාදය*** ඇසුරින් සාකච්ඡා කරන්න.

## II කොටස - ග්‍රීක සාහිත්‍යය සිද්ධාන්ත

9. කාව්‍යය සහ කවියන් පිළිබඳ ප්ලේටෝ දරණ මතය ඔහුගේ **ජනරජය** කෘතිය ඇසුරින් විමර්ශනය කරන්න.

10. ඇරිස්ටෝටල්ගේ **පොයටික්ස්** හි දැක්වෙන පරිදි "අනුකරණය" (*mimesis*) සංකල්පය විශ්ලේෂණාත්මකව අගයන්න.

11. ලොංජයිනස්ගේ **ඔන් ද සබ්ලයිම්** කෘතිය ලේඛකයින්ට ප්‍රායෝගික අත් පොතක්ද? ඔබගේ පිළිතුර එම ග්‍රන්තයේ උචිත උදාහරණ සමඟ විමසන්න.

12. ඩිමිට්‍රියස් විසින් ඉදිරිපත්කර ඇති ශෛලියන් හතර පිළිබඳව ඔහුගේ **ඔන් ස්ටයිල්** කෘතිය ආශ්‍රයෙන් ගවේශනය කරන්න.

(20x4)

පේරාදෙණිය විශ්වවිද්‍යාලය
# UNIVERSITY OF PERADENIYA, SRI LANKA

දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය
## CENTRE FOR DISTANCE AND CONTINUING EDUCATION

ශාස්ත්‍රවේදී සාමාන්‍ය උපාධි පරීක්ෂණය බාහිර - 2018 නොවැම්බර්/දෙසැම්බර්
## GENERAL DEGREE EXAMINATION IN ARTS (EXTERNAL) - NOVEMBER/DECEMBER 2018

## රෝම සාහිත්‍යය සහ සාහිත්‍යය සිද්ධාන්ත - WCCG 2
(නව නිර්දේශය)

**මෙහි අඩංගු මුළු ප්‍රශ්න සංඛ්‍යාව දහය (10) කි.**
**පළමු ප්‍රශ්නයටත් එක කොටසකින් අවම වශයෙන් එක ප්‍රශ්නය බැගින් තෝරා ගනිමින් තවත් ප්‍රශ්න හතරකටත් (04) පිළිතුරු සපයන්න.**
**කාලය : පැය තුනයි (03)**

---

1. පහත දැක්වෙන උද්ධෘත පාඨ අතරින් එක් දාර්ශනිකයකුගෙන් අවම වශයෙන් උද්ධෘත පාඨ දෙකක් තෝරා ගනිමින් **හතරක** අවස්ථා සම්බන්ධය දක්වමින් ඒවායේ අන්තර්ගතය පිළිබඳව විග්‍රහ කරන්න.:

   a) For my father, Jupiter is inside now, he has turned himself into Amphitryo's image, and all the servants who see him think that he is him.

   b) My object has been to engage your mind with my verses while you gain insight into the nature of the universe and the pattern of its architecture.

   c) But smooth my path, smile on my enterprise,
   Pity with me the unguided steps of farmers,
   Come forward, and learn already to answer prayer.

   d) The more corrupt the state, the more numerous the laws.

   e) After so many crimes, so many sleights
   Committed on me by that miscreant brother
   In violation of all sacred law.

   f) Look around the arcades, try to pick out a woman
   Who's worthy of your devotion.

(5x4)

## I කොටස - රෝම සාහිත්‍යය

2. ප්ලෝටස් ගේ **ඇම්ෆිට්‍රියෝන්** නාට්‍යයේ දෙවිවරන් නිරූපණය කරන චරිතය විග්‍රහ කරන්න.

3. ආගම සහ දෙවියන්ගේ පැවැත්ම පිළිබඳ එපිකියුරියන් අදහස්, ලුක්‍රිසියස් ඔහුගේ **ඔන් ද නේචර් ඔෆ් යුනිවර්ස්** කෘතියේ ඉදිරිපත් කර ඇති අයුරු විමසන්න.

4. වර්ජිල්ගේ **ජෝර්ජික්ස්** කෘතිය දේශපාලනික කෘතියක් ලෙස සාකච්ඡා කරන්න.

5. ටැසිටස් බලය සහ වහල්භාවය පිළිබඳ දරණ මත **ඇනලස්** කෘතිය ඇසුරින් විමසන්න.

6. "සෙනෙකාගේ **තයෙස්ටීස්** ප්‍රචණ්ඩත්වය සහ කුතුහලය පිළිබිඹු කරන ශෝකාන්තයකි". විමසන්න.

7. ජුවනල්ගේ සැටයර් VI සදාචාරයේ පරිහානිය පිළිබඳ අදහස් ඉදිරිපත් කරන්නේද? විමසන්න.

## II කොටස - සාහිත්‍යය සිද්ධාන්ත

8. වේදිකාව මත නිරූපණය නොකරනු මෙන් ඉදිරිපත් කරන කරුණු කවරේද? ඔහුගේ තහනමට හේතු කවරේද යන්න ඔහුගේ **ආර්ස් පොයටිකා** ඇසුරින් විශ්ලේෂණය කරන්න.

9. සිසෙරෝට අනුව කුමන ආකාරයේ ගුණාංග කථාවක් ලිවීමේදී සහ තර්කයන් ඉදිරිපත් කිරීමේදී සැලකිය යුතුද? මෙය ඔහුගේ කෘති ඇසුරින් සාකච්ඡා කරන්න.

10. අධ්‍යාපනයේ අරමුණු ක්වින්ටිලියන්ගේ මතයට අනුව කවරේද?.

(20x4)

පේරාදෙණිය විශ්වවිද්‍යාලය
# UNIVERSITY OF PERADENIYA, SRI LANKA

දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය
## CENTRE FOR DISTANCE AND CONTINUING EDUCATION

ශාස්ත්‍රවේදී සාමාන්‍ය උපාධි පරීක්ෂණය බාහිර - 2018 නොවැම්බර්/දෙසැම්බර්
**GENERAL DEGREE EXAMINATION IN ARTS (EXTERNAL) - NOVEMBER/DECEMBER 2018**

## ග්‍රීක චින්තනය WCCG 3
(නව නිර්දේශය)

**මෙම ප්‍රශ්න පත්‍රයෙහි අඩංගු මුළු ප්‍රශ්න සංඛ්‍යාව නමයකි (09).**
**පළමු (01) ප්‍රශ්නයටත්, එක් කොටසකින් ප්‍රශ්න දෙක (02) බැගින් තෝරා ගනිමින් තවත් ප්‍රශ්න හතරකටත් (04) පිළිතුරු සපයන්න.**
**කාලය : පැය තුනයි (03)**

---

1. පහත දැක්වෙන A සහ B කොටස් වලින් අවම වශයෙන් දෙකක් (02) තෝරා ගනිමින් උද්ධෘත පාඨ **හතරක** අවස්ථා සම්බන්ධය දක්වමින් ඒවායේ අන්තර්ගතය පිළිබඳව විග්‍රහ කරන්න.

**A කොටස: *ප්ලේටෝගේ ජනරජය* (REPUBLIC)**

a) That is what I meant by saying that we must start to educate the mind before training the body.

b) Then you say that the artist's representation stands at third remove from reality?

c) And further, we have often heard it said and often said ourselves that injustice consists in minding your own business and not interfering with other people.

**B කොටස: *ඇරිස්ටෝටල්ගේ ආචාරධර්මවාදය* (ETHICS)**

d) Acts which are the effects of passion are surely the very last that can be called acts of deliberate choice.

e) Justice is the only virtue which is regarded as benefiting someone else than its possessor.

f) It is not only that friendship is necessary to the good life, it is in itself a good and beautiful thing.

(5x4)

## I කොටස - ප්ලේටෝගේ ජනරජය (REPUBLIC)

2. ප්ලේටෝ විසින් ඉදිරිපත් කර ඇති ආකෘති පිළිබඳ න්‍යාය **ජනරජය** කෘතිය ඇසුරින් විමසන්න.

3. තරුණ අවධියේදී දෙවිවරු අසාධාරණ ලෙස කටයුතු කරන ආකාරය පිළිඹිබු කරන කතා ඇසීමට ඉඩ දීමෙන් ඔවුන්ට වියහැකි හානිය පිළිබඳ සොක්‍රටීස් දරණ මතය කුමක්ද? එය උදාහරණ මඟින් සාකච්ඡා කරන්න.

4. "සොක්‍රටීස් ප්‍රජාතන්ත්‍රවාදයට අප්‍රසාදය පළ කරයි." සොක්‍රටීස් ප්‍රජාතන්ත්‍රවාදය ලෙස සලකන අදහස නිර්වචනය කර එම නිර්වචනය වර්තමාන ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ සැලකෙන අර්ථයට පටහැනි වන ආකාරය සාකච්ඡා කරන්න.

5. ප්ලේටෝ ගේ ගුහාව පිළිබඳ උපමාව ලෙස සලකන අදහස නිර්වචනය කර ඥානය අත්පත්කරගන්නා ආකාරය පැහැදිලි කරන්නේ කෙසේද?

## II කොටස - ඇරිස්ටෝට්ල්ගේ ආචාරධර්මවාදය (ETHICS)

6. සදාචාරය සහ දේශපාලනය අතර ඇති සම්බන්ධතාවය ඇරිස්ටෝට්ල්ගේ **ආචාරධර්මවාදය** හරහා විශ්ලේෂණය කරන්න.

7. ඇරිස්ටෝට්ල්ගේ මධ්‍යන්‍යාය පිළිබඳව එහි අන්ත සහ ඌණතා සලකා බලමින් විග්‍රහ කරන්න.

8. ඇරිස්ටෝට්ල්ගේ **ආචාරධර්මවාදය** සිද්ධාන්තමය ද නැතහොත් ප්‍රායෝගික නිබන්ධනයක්ද යන්න විශ්ලේෂණය කරන්න.

9. ඇරිස්ටෝට්ල් විසින් ඉදිරිපත් කර ඇති මිත්‍රත්වය පිළිබඳ අදහස් ගවේශනය කරන්න.

(20x4)